# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි පළමුවන වසර පරීක්ෂණය (බාහිර)-2016

2022 - මැයි

BCOME 1035 – මූල්‍ය ගිණුම්කරණය

ප්‍රශ්න සංඛ්‍යාව : හතරයි (04)

කාලය : පැය 03 යි

සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

---

**ප්‍රශ්ණ අංක 01**

අ. මූල්‍ය ප්‍රකාශන භාවිතා කරන පාර්ශවකරුවන් පස්දෙනෙකු හඳුනාගන්න.

(ලකුණු 05)

ආ මූල්‍ය ප්‍රකාශන වල ප්‍රධාන සංරචක ලෙස වත්කම්, වගකීම්, ස්කන්ධය, ආදායම් සහ වියදම් නම් කළහැක. එම සංරචක පහ උදාහරණයක් සහිතව කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ඇ. ව්‍යාපාරයක තීරණ ගනු ලබන පාර්ශවයන් සඳහා මූල්‍ය ගිණුම්කරණයේ වැදගත්කම පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 25)

**ප්‍රශ්ණ අංක 02**

අ. ශාඛා වර්ගීකරණය කර එම එක් එක් ශාඛා වර්ග කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ආ. පහත සඳහන් එක් එක් ගනුදෙනු ප්‍රධාන කාර්යාලයේ සහ ශාඛාවේ ගිණුම් පොත්වල සටහන් කරන්න.

i. ශාඛාවට යවන ලද භාණ්ඩ /ප්‍රධාන කාර්යාලයෙන් ලද භාණ්ඩ රු. 1,250,000

ii. ඉහත භාණ්ඩ තොගයෙන් රු. 25,000 ක් වටිනා භාණ්ඩ ශාඛාව විසින් නැවත ප්‍රධාන කාර්යාලයට යවන ලදී.

iii. ශාඛාව විසින් ශාඛාව වෙනුවෙන් දරන ලද වියදම රු. 11,000 කි.

iv. ශාඛාවේ ගොඩනැගිලි කුලිය වන රු. 40,000 ක් ප්‍රධාන කාර්යාලය විසින් ගෙවන ලදී.

v. ශාඛාව විසින් ණය පදනම මත රු. 950,000 ක් වටිනා භාණ්ඩ බාහිර පාර්ශවයකින් මිලදී ගන්නා ලදී.

vi. ශාඛා අලෙවිය (ණය පදනම මත) රු. 5,625,000

vii ශාඛාවට අදාල ණයගැතියන් විසින් ප්‍රධාන කාර්යාලයට කරන ලද ගෙවීම රු. 450,000 කි.

viii. රු. 110,000 ක් වටිනා ශාඛාවෙහි මිලදී ගැනීම් ප්‍රධාන කාර්යාලය විසින් දරන ලදී.

ix. රු. 820,000 ක් වටිනා උපකරණ ශාඛාව විසින් මිලදී ගන්නා ලදී.

x. ශාඛාව විසින් රු. 450,000 ක් වටිනා ගෘහභාණ්ඩ මිලදී ගත් නමුත්, එම ගෘහභාණ්ඩ ගිණුම පවත්වාගෙන යනු ලබන්නේ ප්‍රධාන කාර්යාලය විසිනි.

(ලකුණු 20)
(මුළු ලකුණු 25)

**ප්‍රශ්න අංක 03**

අ. අංජලී සහ භානු ට්‍රේඩර්ස්හි 2021 මාර්තු 31 දිනට ශේෂ පත්‍රය පහත පරිදි වේ.

| **වගකීම්** | **රු.** | **වත්කම්** | **රු.** |
|---|---|---|---|
| හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් | | ගොඩනැගිලි | 225,000 |
| - අංජලී | 115,000 | කීර්තිනාමය | 51,000 |
| - භානු | 115,000 | ආයෝජන | 38,000 |
| ආයෝජන අරමුදල | 61,000 | ණයගැතියෝ - අඩමාණ ණය වෙන්කිරීම (55,000 - 5,000) | 50,000 |
| අංජලි - ණය | 26,000 | තොගය | 11,000 |
| භාණු - ණය | 15,000 | බැංකු ශේෂය | 55,000 |
| ණයහිමියෝ | 98,000 | | |
| එකතුව | 430,000 | එකතුව | 430,000 |

අංජලී සහ භානු ලාභ අලාභ සම සමව බෙදාගනී. 2021 මාර්තු 31 දින ව්‍යාපාරය විසුරුවා හැරීමට ඔවුන් විසින් තීරණය කරන ලදී. එදින පහත සඳහන් ගනුදෙනු සිදුවිය.

i. අංජලීගේ සම්පූර්ණ ණය මුදල පියවා ගැනීම සඳහා ඇය විසින් රු. 5,000 ක් වටිනා භාණ්ඩ තොගයක් රැගෙන යන ලදී.

ii. භානු විසින් ආයෝජනයෙන් හරි අඩක් වටිනාකමින් 15% ක් අඩුවෙන් රැගෙන යන ලදී.

iii. ණයගැතියන් රු. 47,000 කට උපලබ්ධි විය.

iv. ණයහිමියන්ගේ වටිනාකමින් රු. 6,000 ක් අඩුවෙන් පියවන ලදී.

v. ගොඩනැගිලි රු. 300,000 කට උපලබ්ධි විය.

vi. කීර්තිනාමය රු. 60,000 කට උපලබ්ධි විය.

vii. ඉතිරි වූ ආයෝජනය රු. 15,000 කට අලෙවි කරන ලදී.

viii. පොත්වල සටහන් නොවූ පැරණි කාර්යාල උපකරණ, භානු විසින් රු. 15,000 කට පවරා ගන්නා ලදී.

ix. උපලබ්ධි වියදම රු. 20,000 කි.

ඔබ විසින් පහත ගිණුම් පිළියෙල කිරීම අවශ්‍ය වේ.

1. උපලබ්ධි ගිණුම
2. හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම්
3. බැංකු ගිණුම

(ලකුණු 15)

ආ. පහත යෙදුම් කෙටියෙන් පැහැදිලි කරන්න.

i. දේපල, පිරියත හා උපකරණ
ii. ගිණුම්කරණ පරිසරය
iii. වෙනත් විස්තීරණ ආදායම්
iv. ණය ගැනීමේ පිරිවැය
v. ව්‍යාපාර ඒකකය

(ලකුණු 2x5 =10)
(මුළු ලකුණු 25)

**ප්‍රශ්ණ අංක 04**

අර්ජුන සහ විජිත, 3 : 2 අනුපාතයට ලාභ අලාභ බෙදා ගනිමින් හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. ඔවුන් විසින්, හවුල් ව්‍යාපාරය , සංජය සමඟ ඒකාබද්ධ කර ගැනීමට 2021 මාර්තු 31 දින තීරණය කරන ලදී.

2021 මාර්තු 31 වන දිනට ඔවුන්ගේ මූල්‍ය තත්වයන් පහත පරිදි වේ.

| වගකීම් | A&V හවුල් ව්‍යාපාරය | සංජය ව්‍යාපාරය | වත්කම් | A&V හවුල් ව්‍යාපාරය | සංජය ව්‍යාපාරය |
|---|---|---|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම් | | | | | |
| - අර්ජුන | 100,000 | | කාර්යාල ගොඩනැගිලි | 80,000 | - |
| - විජිත | 80,000 | | ගෘහ භාණ්ඩ | 24,000 | 15,000 |
| - සංජය | - | 60,000 | ආයෝජන | - | 30,000 |
| ජංගම ගිණුම් | | | තොගය | 60,000 | 45,000 |
| - අර්ජුන | 34,000 | | ණයගැතියෝ | 24,000 | 18,000 |
| - විජිත | 28,000 | | අඩුකලා අඩමාණ ණය වෙන්කිරීම් | (2000) | - |
| - සංජය | - | 8,000 | බැංකු ශේෂය | 82,000 | - |
| මහේෂ්ගෙන් ගත් ණය | | 20,000 | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| ණයහිමියෝ | 26,000 | 16,000 | | | |
| බැංකු අයිරාව | - | 4,000 | | | |
| එකතුව | 268,000 | 108,000 | එකතුව | 268,000 | 108,000 |

පහත සඳහන් කොන්දේසි මත ව්‍යාපාර දෙක ඒකාබද්ධ විය.

i. ලාභ හා අලාභ බෙදා ගැනීමේ අනුපාත

අර්ජුන - 2/5

විජිත - 2/5

සංජය - 1/5

ii. නව ව්‍යාපාරයේ පොත්වල කීර්තිනාම ගිණුමක් පවත්වා ගැනීමට එකඟ විය. ඒ සඳහා අයිතිකරුවන් පහත සඳහන් අයුරින් දායක විය.

A&V හවුල් ව්‍යාපාරය - රු. 120,000

සංජය ව්‍යාපාරය - රු. 40,000

iii. A&V හවුල් ව්‍යාපාරයේ වත්කම් පහත පරිදි ඇස්තමේන්තු විය.

| | |
|---|---|
| කාර්යාල ගොඩනැගිලි | රු. 110,000 |
| ගෘහභාණ්ඩ | රු. 21,000 |
| තොගය | රු. 69,000 |
| ණයගැතියෝ | රු. 23,200 |

iv. සංජය විසින් , ඔහුගේ ව්‍යාපාරයේ ආයෝජනය රු. 46,000 කට අලෙවි කරන ලදී. එම මුදලින් සංජය විසින් මහේෂ්ට තිබූ ණය මුදල හා බැංකු අයිරාව පියවා, ඉතිරිය නව ව්‍යාපාරයට රැගෙන යන ලදී.

අවශ්‍ය වන්නේ,

අ. A&V හවුල් ව්‍යාපාරයේ පොත් වසා දැමීමට 2021 මාර්තු 31 දිනට ලෙජර් ගිණුම් සකස් කරන්න.

(ලකුණු 10)

ආ. සංජය (පුද්ගලික) සමාගමේ පොත් වසා දැමීමට 2021 මාර්තු 31 දිනට ලෙජර් ගිණුම් සකස් කරන්න.

(ලකුණු 10)

ඇ. 2021 මාර්තු 31 දිනට නව ව්‍යාපාරයේ ශේෂ පත්‍රය සකස් කරන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 25)